සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security - Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2020.06.30

සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක :-2020/07ට තුන්වන එකතුව

සියළුම සමෘද්ධි ප්‍රජාමුල බැංකු/ බැංකු සමිති කළමනාකරුවන් සහ
සමෘද්ධි බැංකු සමිති විධායක කමිටු/ සමෘද්ධි බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන් වෙත,

**<u>Covid-19 වෛරස වසංගත තත්ත්වය මත බලපෑමට ලක් වූ සමෘද්ධි බැංකු / බැංකු සමිති සාමාජිකයින්ට ණය මුදල් ගෙවීමට සහන සැලසීම</u>**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමියගේ උපදෙස් සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩල ආවරණ අනුමැතියට යටත්ව 2020.06.08 දින නිකුත් කරන ලද සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ අංක 2020/07 සහ ඊට අදාල නිකුත් කරන ලද පළමු සහ දෙවන එකතුන්හී සඳහන් සියළු උපදෙස් ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවන බව කාරුණිකව දන්වමි.

**02.** Covid-19 වෛරස් රෝගී තත්වය මත බලපෑමට ලක්වූ සමෘද්ධි ප්‍රජා මූල බැංකු/ ප්‍රජා මූල බැංකු සමිති ණයකරුවන්ට 2020.03.15 දින සිට 2020.09.14 දින දක්වා සහන ලබාදීම සම්බන්ධව උපදෙස් ලැබෙන තුරු 2020.09.14 දින දක්වා ණය අය කරගැනීම අත්හිටුවිය යුතු බවත්, මේ සම්බන්ධව ප්‍රජා මූල සංවිධාන නායකයන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් හරහා ණය ගණුදෙනු කරුවන් කඩිනමින් දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

**03.** යම් ණයකරුවකු තම අභිමතය මත මාසික ණය වාරික ගෙවීමට කැමැත්තෙන්ම ඉදිරිපත් වන විටකදී අදාල මුදල සාමාජික තැන්පත් ගිණුමට හෝ අදාල තැන්පත් ගිණුමට රැස් කළ යුතුය. පසුගිය ණය වාරිකවලට අදාල පොලිය ගණනය කිරීම පිළිබඳව ද පසුවට උපදෙස් ලබාදෙනු ඇත.

04. පරිගණක මෘදුකාංගය යටතේ ණය අයවීම් සිදු කිරිමේදී අදාල කාර්යය මෘදුකාංග සමාගම් සමඟ සාකච්ජා කර වෙනස්කම් සිදු කර ගත යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

wajira

**05.** මෙම ව්‍යසන තත්ත්වය තුළින් ඇතිවූ බලපෑම මඟ හරවාගෙන ඉදිරියේදී, තම ආර්ථික කටයුතු නගා සිටුවීමට ලබාදෙන සහනය ගණුදෙනු කරුවන්ට සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු වලට අගතියක් නොවන පරිදි ලබාදීමට ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය තිරණය කර ඇති බව ද කාරුණිකව සඳහන් කරමි.

06. සමෘද්ධි බැංකු/ බැංකු සමිති නව ණය නිකුත් කිරිමේ කටයුතු තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක කළ යුතු බව ද දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

| | | |
|---|---|---|
| 01. | ගරු අමාත්‍ය, කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - ඔබතුමියගේ උපදෙස් පරිදි අනුව සහ කා.දැ.ස |
| 02. | ලේකම් , කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - කා.දැ.ස |
| 03. | ලේකම් , සමාජ ආරක්ෂණ අංශය | - කා.දැ.ස |
| 04. | සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - කා.දැ.ස |
| 05. | ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| 06. | අධ්‍යක්ෂ- ක්ෂුද්‍රමූල්‍ය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| 07. | සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - කා.දැ.ස හා අ.ක.ස. |
| 08. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - කා.දැ.ස. හා අ.ක.ස. |
| 09. | සියළුම අංශ ප්‍රධානීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| 10. | සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - අ.ක.ස. |